**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය - 2020**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---------------------------------

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

---

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 129 (ඇ) ඡේදය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන තේරුම් ගැනීමේදී සහ සැසඳීමේදී උපකාරී වන අයුරින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුහුණතෙහි ඉදිරිපත් කර ඇති අයිතමවලට උපකාරක තොරතුරු එක් එක් ප්‍රකාශනය සහ එක් එක් රේඛීය අයිතමය ඉදිරිපත් කර ඇති අනුපිළිවෙලට හෙළිදරව් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | මූල්‍ය තත්ව ප්‍රකාශනය , මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයන්හි මුහුණත උපලේඛන සමග යොමු අංක නොවෙනස්ව නව ආකෘතියෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව 2020 වර්ෂයේ ද රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර පසුගිය වර්ෂයන් සමග ගැලපෙන පරිදි උපලේඛන අංක සමග නොවෙනස්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී. විගණන නිරීක්ෂණ මඟින් යෝජනා කර ඇති පරිදි 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී උපලේඛන අංකනය කිරීමේ දී අනුපිළිවෙලින් සකස් කර ඉදිරිපත් කරන බව මෙයින් දන්වමි. | ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින පිරිවැය රු. 1,147,100 ක් වූ ප්‍රධාන කාර්යාලයේ විදුලි ජනක යන්ත්‍රයක් ඇතුළු කාර්යාල උපකරණ, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ | එකඟවෙමි.<br>අධිකාරියේ වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කරන ලද්දේ තක්සේරු දෙපාර්තමේන්තුව සහයෙනි. ඒ අනුව 2021 වර්ෂයේ ප්‍රත්‍යාගණන වටිනාකම අනුව අවසාන ගිණුම් තුළ ගැලපීම් කිරීමට සටහන් කර ගතිමි. | වත්කම්වල ඵලදායී ජීවකාලය නැවත සමාලෝචනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගිණුම්කරණ ප්‍රමිති 07 හි 92 (ආ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර මෙම වත්කම් පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව සංශෝධනය කර නැවත මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 වන ඡේදය අනුව දේපළ පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත් වන මුළු වත්කම් පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ ලී බඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ සහ අධිකාරිය සතු වාහන 36 න් 18 ක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. එසේම රු. 38,815,350 ක වටිනාකමකට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අධිකාරියට අයත් ඉඩම් 2005 දෙසැම්බර් 31 දිනෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. එම නිසා විශාල මිල වැඩිවීමක් පවතින මෙම ඉඩම් වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපනය නොවන බවද නිරීක්ෂණය විය. | රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත 7 හි 49 වන ඡේදය අනුව දේපල පිරියත උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේ දී දේපල පිරියත හා උපකරණ පන්තිය මුලුමනින්ම ප්‍රත්‍යාගණනය කළයුතු වුවද ප්‍රත්‍යාගණනයේ දී අදාළ වර්ෂයේ මිලදී ගත් වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කර නොමැත. 2021 වර්ෂයේ දී ගිණුම් සැකසීමේ දී ප්‍රත්‍යාගණනය ඇතුළත් නොවූ වත්කම් ප්‍රත්‍යාගණනය කර ගැලපීම් කිරීමට කටයුතු කරමි.<br>2020 වර්ෂයේ වාහන ප්‍රත්‍යාගණනයට ඇතුළත් නොවූ වාහන 2021 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කිරීමට සටහන් කර ගතිමි.<br>ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 මගින් නිර්දේශ කර ඇති පරිදි දේපල පිරියත හා උපකරණ සෑම වර්ෂ 3 කට හෝ 5 කට වරක් ප්‍රත්‍යාගණන කළ යුතු බව දක්වා ඇත. අවසන් වරට ඉඩම් ප්‍රත්‍යාගණනය පෞද්ගලික තක්සේරුකවන් දෙදෙනෙකු මගින් සැලකිය යුතු මුදලක් ගෙවා සිදු කර ගන්නා ලදී. නමුත් වාර්ෂිකව වෙන්වූ ප්‍රතිපාදන ප්‍රමාණයන් සීමාවීම් මත මෙවැනි කාර්යයන් ප්‍රමිතිය පරිදි සිදු කර නොහැකිවී ඇත. නමුත් 2020 වර්ෂයේ අධිකාරිය සතු ඉඩම් ප්‍රත්‍යාගණනය කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. | දේපළ, පිරියත හා උපකරණ පන්තියම ප්‍රමිතිය ප්‍රකාර මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය. එසේම සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් ඉඩම් ප්‍රත්‍යාගණනය කළ යුතුය. |
| (ඈ) අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් සහ වෙනත් රජයේ ආයතනවලින් ආධාර හා ප්‍රදාන වාර්ෂිකව ලැබෙන නමුත් එම ආධාර හා ප්‍රදාන ගිණුම්ගත | මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට අමතරව විගණන නිරීක්ෂණ මගින් පෙන්වා දෙන පරිදි 2021 වර්ෂයේ ගිණුම් සටහන් මගින්ද අනාවරණය කිරීමට සටහන් කරගතිමි. | ආධාර හා ප්‍රදාන ගිණුම්ගත කිරීමට අදාළ ප්‍රතිපත්ති සහ ආධාර ලබාදීමේ කොන්දේසි මූල්‍ය |

| | | |
|---|---|---|
| කිරීමට අදාල ගිණුම් ප්‍රතිපත්තිය එම අධාර හා ප්‍රදාන ලබාදීමේ කොන්දේසිද ඇතුලත්ව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ පමණක් අධිකාරියට ලැබී තිබුණු ආධාර හා ප්‍රදානවල අගය රු.මිලියන 1,088 ක් විය. | | ප්‍රකාශන තුළ අනාවරණය කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කුඩා තේ වතු සංවර්ධන සමිති සඳහා 1998 වර්ෂයේදී ණය පදනම යටතේ ලබාදී තිබූ වාහන 102 ක හිඟ ණය වාරික වෙනුවෙන් 2019 වර්ෂය දක්වා ලැබිය යුතු ශේෂය වූ රු. 6,664,321 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව පොත්වලින් කපාහැර වාහන 23 ක් විකිණීමෙන් ලැබී තිබුණු එහෙත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු රු. 9,207,958 ක මුදලට සදොස් ලෙස හිලව් කර ඉතිරි වූ රු. 2,491,162 ක් විවිධ ආදායම් ගිණුමට මාරුකර තිබුණි. ඒ අනුව එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේදී ආදායම වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සමිතිවලින් තවදුරටත් අයවිය යුතු ණය ප්‍රමාණය ප්‍රතිව්‍යුහගත වාහන ණය ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමිතිවලින් ණය නොගෙවූ වාහන අත්පත් කරගෙන විකුණුම් වාහනවල වටිනාකම භාණ්ඩාගාරයට නිරවුල් කළ යුතු බැවින් ගෙවිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කරන ලදී. එනමුත් 2019 විගණන වාර්තාව මඟින් ප්‍රතිව්‍යුහගත ණය ශේෂයන් අදාළ නිරවුල් කළ යුතු මුදල හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කර නොතිබුණු බව නිරීක්ෂණ යටතේ දක්වා තිබුණි. එය නිවැරදි කරමින් 2020 මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කරන ලදී. එසේම එම ගැලපීම පිළිබඳ ගිණුම් සටහන් මඟින් හෙළිදරව් කර ඇති නමුත් සදොස් ලෙස හිලව් කිරීමක් ලෙස දක්වා ඇත. ඒ අනුව 2021 ගිණුම් තුළින් යෝජිත පරිදි නිවැරදි කර ගැලපීම් කිරීමට සටහන් කර ගතිමි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් ගැලපීම් නිවැරදි කළ යුතු අතර වාහන විකිණීමෙන් ලද මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ රු. 5,427,829 ක් වූ පොලී ආදායම මත ගෙවියයුතු රු. 1,302,679 ක ආදායම් බදු වගකීම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය 1975 අංක 35 දරණ පනත යටතේ ස්ථාපිත අධිකාරියකි. මෙම අධිකාරියේ මූලික අරමුණ ලාභ ලැබීම නොවන අතර කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්වය උසස් කිරීමට අදාළ උපකාරක සේවා සැපයීමයි. එබැවින් අධිකාරිය බදු ගෙවීම් වලින් නිදහස් කර ඇත. එසේම පොලී ආදායමට සෘජුවම අදාළ වන රඳවා ගැනීමේ බදු අඩු කළ පසු අගය, පොලී ආදායම ලෙස ගිණුම්ගත කර | පොලී ආදායම මත ගෙවිය යුතු ආදායම් බදු මුදල් ගණනය කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ඇත. නිරීක්ෂණ තුළ පෙන්වා දී ඇති පොලී ආදායම මත බදු ප්‍රමාණය වන රු. 1,302,679 ක බදු ගෙවිය යුතු ලෙස හෝ බදු පැහැර හැරීමක් පිළිබඳ ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් කිසිදු ආකාරයක දැනුම් දීමක් සිදුව නොමැති බව දන්වමි. | |
| (ඇ) 2017 වර්ෂයේ ඇති වූ ගංවතුර ආපදාව හේතුවෙන් කුඩා තේ ඉඩම්වලට සිදු වූ හානිය වෙනුවෙන් සහනාධාර දීමනාවක් ගෙවීමට ලබාදී තිබූ මුදලින් ඉතිරි වූ රු. 46,991,673 ක් සහ තේ පොහොර ව්‍යාපෘතිය යටතේ ගොවීන්ට සහනාධාර ගෙවීම සඳහා 2016 වර්ෂයේ අධිකාරියට ලබාදී තිබූ මුදලින් ඉතිරි රු. 21,335,907 ක් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළයුතුව තිබුණද වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල නොදක්වා පෙර වර්ෂ ගැලපීම් ලෙස සමුච්චිත අතිරික්තයට ගලපා තිබුණි. මෙම නිසා අධිකාරියේ වගකීම් ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන්ද සමුච්චිත අතිරික්තය වැඩියෙන්ද දක්වා තිබුණි. | 2017 වර්ෂයේ ගංවතුර ආපදාවට ලක් වූ ඉඩම් වෙනුවෙන් ලබා දුන් සහනාධාර ගෙවීම් කර ඉතිරි වූ මුදල් අමාත්‍යාංශයට දැනුම් දී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත නැවත වගා, අලුත් වගා සහ පාලු සහනාධාර වෙනුවෙන් ගෙවීම් කර ඇත. එබැවින් ගිණුම්තුළ සටහන්ව තිබූ රු. 46,991,673 ක මුදල නාමික වටිනාකමක් පමණක් වූ අතර අදාළ වර්ෂයේ දී ගැලපීම් සටහන් සිදු නොවීම මත ගිණුම්තුළ පෙන්නුම් කළ ශේෂයකි. 2016 වර්ෂයේ තේ පොහොර සහනාධාර ලෙස ප්‍රාදේශීය කාර්යාල මඟින් රු.මිලියන 1275.95 ක ප්‍රමාණයක් ගෙවීම් කර ඇත. එම කරන ලද ගෙවීම් අතරින් රු.21,335,907 ක මුදල ගොවීන් විසින් ලද චෙක්පත් ඉදිරිපත් කර මුදල් කර නොතිබුණි. එම මුදල් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය තුළින් නියමිත කාලය තුළ වගාව අවසන් කරන කුඩා තේ වතු හිමියන් දිරිගැන්වීමට ආයුධ කට්ටල මිලදී ගැනීම සඳහා යොදා ගෙන ඇත. මෙම නාමික ශේෂයන් තවදුරටත් ඉදිරියට ගෙනයාම වෙනුවට රදවාගත් ඉපයීම් ගිණුමට මාරු කරමින් සටහන් මඟින් ගැලපීම් හෙළිදරව් කිරීමට කටයුතු කරන ලදී. | සහනාධාර දීමනා ගෙවීමෙන් පසු ඉතිරි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු අතර භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වියදම් නොකළ යුතුය. |

### 1.5.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනය සමඟ අදාළ ප්‍රාදේශීය කාර්යාලවල මූල්‍ය ප්‍රකාශන සැසඳීමේදී විෂයයන් 4 කට අදාළව දක්වා තිබුණු අගයන්වල රු.926,505 ක වෙනසක් නිරීක්ෂණය වුවද එම වෙනස්කම් සසඳා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් අධ්‍යනයේ දී මෙවැනි වෙනසක් නිරීක්ෂණය නොවේ. ඊට අදාළ උපලේඛන ඉදිරිපත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල හා ප්‍රාදේශීය කාර්යාලවල ගිණුම් වාර්තාවන්හි පවත්නා වෙනස්කම් සැසඳීම් කර වැරදි නිවැරදි කළ යුතුයි. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.3 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රධාන කාර්යාලයේ වටිනාකම රු. 24,690,000 ක් වූ සත්දින ඉල්ලුම් තැන්පත් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබියයුතු පොලී ආදායම් වල එකතුව වූ රු. 3,109,378 ක් ආයෝජනය කිරීමකින් තොරව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.තවද මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්වෙන මෙම සත්දින ඉල්ලුම් තැන්පත් දින 365 සිට දින 2,949 ක දීර්ඝ කාල පරාසයක සිට පැවත එන බව විගණනයේදි නිරීක්ෂණය විය. | සත්දින තැන්පතු තුළ ආයෝජනය කර ඇති මුදල්, කමිටුවක් මඟින් ඇගයීම් කර මාස 03 ස්ථාවර තැන්පතු තුළ ආයෝජනය කිරීමේ තීරණ ගැනීම වර්තමානයේ සිදුවේ. ඒ අනුව කෙටි කලක් තුළ අවශ්‍ය වන මුදල් සත්දින තැන්පතු ආයෝජන කිරීම ද එසේ හදිසියේ අවශ්‍ය නොවන මුදල් ස්ථාවර තැන්පතු තුළ ආයෝජනය කිරීම දැනට සිදුවන බව දන්වා සිටිමි. | අතිරික්ත මුදල් අධිකාරියට වාසිදායක වන අයුරින් ආයෝජනය කළ යුතුය. |
| (ආ) 1998 වර්ෂයේ තේ කම්හල් සඳහා වර්ණ විභේදන යන්ත්‍රලබාදීමේ වැඩසටහන මඟින් පෞද්ගලික කම්හල් හතරකට ලබාදී තිබුණු රු. 5,916,589 ක ණය මුදල් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | 1998 වර්ෂයේ තේ කම්හල් සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම වෙනුවෙන් වර්ණ විභේදන යන්ත්‍ර ණය පදනමින් ලබා දී ඇත. ඒ අතරින් කම්හල් 04 කින් තවදුරටත් අයවිය යුතු මුදල රු.5,916,589.00 අතරින් ඊරියගහ කම්හලින් අයවිය යුතු මුදල් වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ග ලෙස නඩු කටයුත්තක් කෙරෙමින් පවතී. ඒ තුළින් රු.2,436,448 අයකර ගැනීමට බලාපොරොත්තු වේ. එසේම ගාල්ල සමූපාකාර සමිතියට ලබාදුන් යන්ත්‍රය වෙනුවෙන් ලැබිය යුතු මුදල් අදාළ සමූපාකාර සමිතියේ වත්කම් ඇවර කිරීමෙන් අනතුරුව වගකීම් නිදහස් කිරීමේ දී අධිකාරියට මුදල් නිරවුල් කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙන බව දන්වා ඇත. ඉතිරි තේ කම්හල් 2 වසා දැමීම හේතුවෙන් මුදල් අයකර ගැනීමේ නොහැකි තත්ත්වයකට පත්ව ඇති බව දන්වමි. | අයවීමේ හැකියාවක් ඇති කම්හල් වලින් අයකරගැනීම සඳහා කඩිනමින් අවශ්‍ය පියවර ගැනීම සහ වසා දමන ලද කම්හල් සම්බන්ධයෙන් විශේෂ කමිටුවක් මඟින් තව දුරටත් පරීක්ෂා කර සුදුසු තීරණයකට එළඹිය යුතුය. |

### 1.6.4 ගෙවිය යුතු මුදල්

---------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පස සංරක්ෂණය වෙනුවෙන් ප්‍රධාන කාර්යාලය, නුවරඑළිය, රත්නපුර හා කෑගල්ල යන ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයන්හි ගොවීන්ට සහනාධාර දීමනාවක් ගෙවීමට ලබාදී තිබූ මුදලින් ඉතිරි රු.13,812,613 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර ගිණුම්වල රඳවාගෙන තිබුණි. | පාංශු සංරක්ෂණ සහනාධාර ගෙවීම අධිකාරියේ ක්‍රියාකාරි සැලැස්ම තුළ පැවති ක්‍රියාකාරකම් නිසාවෙන් මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමක් සිදු නොවේ. එම මුදල් ඉදිරියේ දී සහනාධාර ගෙවීම සඳහා යොදා ගැනීම සිදු වන බව දන්වා සිටිමි. | පස සංරක්ෂණය සඳහා ලබා දෙන ලද සහනාධාර ඉතිරි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු අතර භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වියදම් නොකළ යුතුය. |
| (ආ) 2019 වර්ෂයේ කාබනික පොහොර මෙට්‍රික් ටොන් 4,924 ක් මිලදී ගැනීම සඳහා පුද්ගලික සමාගමකට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණද සපයන ලද පොහොර, අවශ්‍යතාවයට අනුකූල නොවූ බැවින් එම වර්ෂය තුළම මෙම ප්‍රසම්පාදනය නතර කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළදී ඉහත සමාගමට රු. 7,377,661 ක් ගෙවිය යුතු බවට ගිණුම් ගතව තිබූ අතර සපයා ඇති පොහොර ප්‍රමාණයේ නිවැරදිතාවය තහවුරු කරගත් බවට සාක්ෂි ගොනු කර නොතිබුණි. | කොම්පෝස්ට් පොහොර මෙට්‍රික් ටොන් 4,924 ක් සැපයීම සඳහා පුද්ගලික සමාගමක් වෙත ලබා දී තිබුණද එම ආයතනය සමග ගිවිසුම්ගතවී ඇත්තේ 2019/09/11 දිනය. එබැවින් 2019 වසරේ මහකන්නයේ සිටුවන ලද පැළ සඳහා පමණක් මෙම පොහොර යොදා ගැනීමට සිදුවී ඇත. ඒ අනුව ගොවියන්ගේ ඉල්ලීම මත පොහොර මෙ.ටොන්. 601.5 ක් පමණක් එම ආයතනය විසින් ගොවීන් වෙත ලබාදී ඇත.මෙම ලබාදුන් පොහොර ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය මඟින් සාම්පල් පරීක්ෂා කිරීමෙන් පසු අදාල මුදල් ගෙවා ඇත. එම මුදල් ගෙවීමේදී ගොවීන් විසින් මෙම පොහොර ප්‍රමාණය ලබාගත් බවට අත්සන් තබන ලද ලේඛනය පරීක්ෂා කර මුදල් නිදහස් කර ඇත. | අධිකාරියේ සෘජු අධීක්ෂණය යටතේ වාර්තා තබාගනිමින් ගොවීන් වෙත කොම්පෝස්ට් පොහොර ලබා දීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ.681 | | | |

| | | | |
|---|---|---|---|
| | රූපවාහිනිය මඟින් ප්‍රචාරණය කිරීම අත්‍යන්තයෙන්ම අවශ්‍යයයි සැලකෙන අවස්ථාවලදී අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් පසු ප්‍රචාරණ කටයුතු කළ යුතු වුවද එලෙස පූර්ව අනුමැතියකින් තොරව රූපවාහිනිය මඟින් සිදුකරනු ලැබූ ප්‍රචාරණ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 1,741,880 ක් වැයකර තිබුණි. | 2019 වර්ෂයට අදාළ මෙම ගෙවීම සඳහා තොරතුරු අතපසු වීම හේතුවෙන් උපචිත වියදම් තුළට ඇතුළත්ව නොතිබුණි. අදාළ රූපවාහිනි නාලිකාවට ලැබිය යුතු මුදල් නොලැබීම හේතුවෙන් අධිකාරියට විරුද්ධව නෛතික ක්‍රියාමාර්ග ගන්නා බවට එන්තරවාසියක් එවා ඇත. අදාළ සේවාව නිවැරදිව ලබාගෙන ඇති හෙයින් ද මු.රෙ.115 ප්‍රකාරව අධිකාරියේ ගණන්දීමේ නිලධාරින්ගේ විශේෂ අනුමැතිය තුළින් ගෙවීම් සිදු කළ බව කාරුණිකව දන්වමි. | ප්‍රචාරණ කටයුතු සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| (ii) මු.රෙ.682 | දේශපාලනයෙහි නිරත පුද්ගලයන් සහ දේශපාලන පක්ෂ හුවා දැක්වෙන ප්‍රවෘත්ති පත්‍ර අතිරේක හා දැන්වීම් පළකිරීම ආයතන ප්‍රධානීන්ට තහනම් වුවද, 2019 සැප්තැම්බර් 08 දින පළ කරන ලද පුවත්පත් දැන්වීමක් සඳහා සමාලෝචිත වර්ෂයේදී විජය පුවත්පත් පුද්ගලික සමාගම වෙත ගෙවීම් කර තිබූ රු. 632,475 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 682 අදාළව සමාලෝචිත වර්ෂයේ දී ප්‍රවෘත්ති අතිරේක හෝ දැන්වීමක් පලකර නොමැති බව දන්වමි. ගෙවීම් නිදහස් කිරීම සිදුව ඇත්තේ උපචිත වියදම් තුළ ඇතුළත් 2019 වර්ෂයට අදාළ වියදම් බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි වල විධිවිධානවල ට යටත්ව ප්‍රචාරණ කටයුතු කළ යුතුය. |
| (iii) මු.රෙ.880 (i) | රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු නිලධාරීන් , රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන, චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි අවංකව ඉටු කරන බවට රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය | මු.රෙ. 880(i) පරිදි වැයපත් සහතික කරන හා චෙක්පත් අත්සන් කරන නිලධාරීන් ද ඇප ආඥාපනතට අනුකූල වෙමින් ඉදිරියේ දී ඇප තැන්පතු ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි වල විධිවිධානවල ට යටත්ව රජයේ නිලධාරීන් විසින් ඇප තැබීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යුතු වුවත් මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තබා තිබුණේ ප්‍රධාන කාර්යාල මුදල් අයකැමි පමණි. | | |
| (ආ) අංක පීඊඩී/12 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් රු. 113,013,766 ක් ස්ථාවර හා කෙටිකාලීන තැන්පතුවල ආයෝජනය කර තිබූ නමුත් ඒ සඳහා අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | මීට ඉහත විගණන වාර්තා වල පෙන්වා දී ඇති පරිදි සේවක පාරිතෝෂිත ගෙවීම් වලට අදාළව මෙම ගිණුම් ආරම්භ කර ඇත.<br>මෙම ආයෝජනයන්ට අදාළ අනුමැතීන් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් හා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගෙන් ලබාගෙන ඇත. | මුදල් ආයෝජනය කිරීමේදී අදාළ අමාත්‍යවරයා ගේ හා මුදල් අමාත්‍යවරයා ගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ) අංක පීඊඩී1/ 2015 හා 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2.2 ඡේදය | මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවන්හීදි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව දරන ලද අමතර ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කළ හැකි වුවද, අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා විසින් සමාලෝචිත වර්ෂයේදී රු.303,041 ක් හා 2021 මාර්තු මාසය දක්වා රු. 86,550 ක් අමතරව ප්‍රතිපූර්ණය කරගෙන තිබුණද, ඊට අදාළ අනුමැතිය චක්‍රලේඛය පරිදි ලබාගෙන නොතිබුණි. | අංක PED/2015 හා 2015 මැයි 25 දිනැති 3.2.2 ඡේදයේ මාසික ඉන්ධන දීමනාවට ප්‍රමාණවත් නොවන අවස්ථාවක සාමාන්‍යාධිකාරිගේ ඉන්ධන වියදම ප්‍රතිපූර්ණය කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා 2017.08.01 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා චක්‍රලේඛවලට අනුකූලව ඉදිරිපත් කර ඇත. එහි දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මේ සමග අමුණා ඇති ඇමුණුම 08 හි සඳහන් තීරණය ලබා දී ඇත. එකී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සැලකිල්ලට ගෙන සාමාන්‍යාධිකාරිගේ අමතර ඉන්ධන වියදම් ප්‍රතිපූරණය සභාපතිවරයාට | චක්‍රලේඛය ප්‍රකාරව විශේෂ අවස්ථාවන්හීදි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් දරන ලද අමතර ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | ඉදිරිපත් කොට සභාපතිවරයාගේ අනුමැතිය මත ගෙවීම් කර ඇත. අදාල පරිදි කටයුතු කිරීමට ඉවහල් වී ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇමුණුම පරිදි වන තීරණය වන අතර අදාල තත්ත්වය නිවැරදි කර ගනිමින් මේ වන විට අදාල අමතර ඉන්ධන ප්‍රතිපූරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරයි. |

**1.8** **බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 7 ඡේදයේ නියමයන්ට පටහැනිව වාර්ෂික පොලී ආදායම මත දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | එකඟවෙමි.<br>2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ලැබිය යුතු පොලී ආදායම මත බදු වෙන් කිරීමට කටයුතු කරන බව දන්වමි. | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව පොලී ආදායම මත ආදායම් බදු ගෙවිය යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

---

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 406, 018, 644 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 78,799,836 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 484,818,480 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන රු. 460,564,538 කින් වැඩිවී තිබීමත් මෙහෙයුම් වියදම් හා සේවක පාරිතෝෂික වෙන්කිරීම් පිළිවෙලින් රු. 33,297,481 කින් හා රු.27,446,273 කින් අඩුවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අක්කර 10 ට අඩු කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය ඉහළනැංවීම අපේක්ෂාවෙන් තේ වගාවේ සංවර්ධනයට ලබාදෙන සහනාධාර පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 25 න් ඉහළ ගොස් තිබුණද කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය සියයට 8.8 කින් අඩුවී ඇති බව සහ ඒ අනුව ජාතික නිෂ්පාදන දායකත්වය සියයට 75 සිට සියයට 73.85 දක්වා පහත බැස ඇති බවද නිරීක්ෂණය විය. | 2020 වසරේ මුල් කාර්තුව තුල සිදුවූ නියඟය හේතුවෙන් කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනයට සැලකිය යුතු හානියක් සිදු වී ඇත. විශේෂයෙන්ම මෙම තත්ත්වයේදී කුඩා තේ වතු අංශයේ ඉඩම්වල කෘත්‍රිම ජල සම්පාදන ක්‍රම වැනි නියඟයට ඔරොත්තු දීම සඳහා වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි.එයට ප්‍රධාන හේතුව වශයෙන් එම කෘත්‍රිම ජල සම්පාදන ක්‍රම ස්ථාපිත කිරීම සඳහා වැයවන මූලික පිරිවැය කුඩා තේ ගොවීන්ට දැරීමට නොහැකි වීමය. 2021 වසරේ මුල් කාර්තුවේදී කුඩා තේ වතු අංශයේ තේ නිෂ්පාදනය කිලෝ මිලියන 17 කින් වර්ධනය වී ඇත.<br>එසේම මෙම නියං තත්ත්වයට ඔරොත්තුදීම සඳහා කුඩා තේ වතු අංශයේ ඉඩම් වල කෘත්‍රිම ජල සම්පාදන ක්‍රම ස්ථාපිත කිරීම හා තේ ඉඩම්වල සෙවන වගාවෙන් යහපත් කෘෂිකාර්මික පිලිවෙත් අනුගමනය කිරීම සඳහා 2021 වසරේ මේ වන විට අධිකාරිය විසින් කෘත්‍රිම ජල සම්පාදන ක්‍රම ස්ථාපිත කිරීම සඳහා අක්කරයකට රු.100,000 ක සහනාධාරයක් ද සෙවන වගාව සඳහා නොමිලේ පැළ ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් පවතී. | මෙම මුදල් සහ ද්‍රව්‍ය ආධාර කුඩා තේ වතු හිමියන් වෙත ගලායාම නිසි පරිදි සිදු වන්නේද යන්න සහ ඒවා අදාළ අරමුණ සඳහාම සම්පූර්ණයෙන්ම උපයෝජනය වන්නේද යන්න මනාව අධීක්ෂණය කළ යුතුය. |
| (ආ)ජාතික ප්‍රතිපත්තියට අනුව උපරිම ඵලදාවක් ලබමින් තේ වගා භූමි ප්‍රමාණය ස්ථායීව පවත්වාගැනීම සඳහා වසරකට සියයට 02 ක් එනම් හෙක්ටයාර් 2,300 ක් තේ නැවත වගාව සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ තේ නැවත වගාව සඳහා ඉලක්ක ගත භූමි ප්‍රමාණය වූ හෙක්ටයාර් 800 න් නැවත වගා කළ භූමි ප්‍රමාණය හෙක්ටයාර් | තේ නැවත වගා ඉලක්ක පිහිටුවීම 2018 වසරේ 3 හා 4 කාර්තුවල හා 2019 වසරේ 1 හා 2 කාර්තු වල බිම් සකස් කරන ලද බිම් ප්‍රමාණය පාදකව සිදුකර ඇත.ඒ අනුව 2019 වසරේ බිම් සකසන ලද හෙක්ටයාර 677 ක් හා 2019 වසරේ බිම් සකසන ලද හෙක්ටයාර 196 යන කාර්යය සාධන අගයන් පාදකව 2020 වසරේ තේ නැවත වගා ඉලක්කය හෙක්ටයාර් 870 ක් වියයුතු වන අතර එම අගය හෙක්ටයාර 800 ට ඉලක්ක කරගත ඇත. එම ඉලක්කයෙන් 2020 වසරේ ජනවාරි මස මහකන්නයේ පැල වගාව සඳහා ඇති වූ දැඩි නියං තත්ත්වය ද 2020 වසරේ මුල් කාර්තුවේ සිදුවූ කොරෝනා වසංගත තත්ත්වයද හේතුවෙන් මෙම පැල සිටුවීමේ ක්‍රියාවලියට බාධා සිදු වී ඇත. එසේම ක්ෂේත්‍රයේ පැල වල හිඟතාවයද මේ සඳහා | ජාතික ප්‍රතිපත්තියට අනුව වගා භූමි ප්‍රමාණය ස්ථායීව පවත්වා ගැනීමට වසරකට සියයට 02 ක් එනම් හෙක්ටයාර් 2300 ක් තේ නැවත වගාව සිදුකළ යුතු වේ. |

| | | |
|---|---|---|
| 648 ක් පමණක් විය. | යම් බලපෑමක් සිදුවී ඇත. මෙම පැල අවශ්‍යතාවය දැනට ක්‍රියාත්මක තේ තවාන් 500 ව්‍යාපෘතිය මඟින් සපුරා ගැනීමට කටයුතු කර ඇත. | |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාව අනුව තේ නැවත වගා සහනාධාරය යටතේ 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පළමු වාරිකය වන බිම් සැකසීම සඳහා හෙක්ටයාර් 7,077 කට සහනාධාර මුදල් ගෙවා තිබුණද නැවත වගාව සිදුකර ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාර් 5,244 ක් පමණක් විය. | හෙක්ටයාර් 1833 ක බිම් ප්‍රමාණයේ තේ නැවත වගාව සිදු නොකිරීමට හේතු වූයේ නියමිත කාලය තුළදී භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීමත් ගොවීන් විසින් පුද්ගලික හේතූන් මත පැල සිටුවීමේ කාර්යය කල් දමා තිබීමත්ය. | සහනාධාරලාභීන් නැවත වගාවට යොමු කළ යුතුය. |
| (ආ) වාර්ෂික වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේ මව් වගා මඟින් රිකිලි අතු නිෂ්පාදනය වාර්ෂික ඉලක්කයෙන් සියයට 51 ක ප්‍රතිශතයක් පමණක් අත්පත්කරගෙන තිබුණු අතර ගාල්ල, මාතර, නුවරඑළිය, කළුතර, හන්තාන යන ප්‍රාදේශීය කාර්යාලවල ස්ථාපනය කර ඇති මව් වගාවන්වල ආදායම ඉක්මවා වියදම් දරා තිබුණි. | 2020 වාර්ෂික මව් වගා රිකිලි නිෂ්පාදනය කිරීම ඉලක්කගත ප්‍රමාණයට ලඟා වීමට නොහැකි වී ඇත්තේ පවත්නා මව් ශාක වසර 21 කට වඩා පැරණි මව් ශාක වීමත් 2020 වර්ෂයේ මව් වගා මඟින් රිකිලි අතු නිෂ්පාදනයේ වර්ෂයේ පැවති නියං කාලගුණ තත්ත්වයත් හේතු වූ බව දන්වා සිටිමි. | මව් වගා මඟින් රිකිලි අතු නිෂ්පාදනය වර්ධනයට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන ආයතනික තේ තවාන් වල අවම වශයෙන් නිෂ්පාදනය සඳහා වැයවන වියදම හෝ ආවරණය කරගත යුතු බව තේ තවාන් කළමණාකරන උපදෙස් මාලාවේ අවධාරණය කර තිබුණද මාවරල හා නෙල්ලිගොල්ල තේ තවාන්වල ආදායම, වියදම් පියවා ගැනීමට හෝ ප්‍රමාණවත් වී නොතිබුණි. තවද තේ තවාන්වල තේ පැළ මියයාමේ ප්‍රතිශතය සියයට 05 ක මට්ටමක පවත්වාගත යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට තේ තවාන්වල පැළ විනාශවීමේ ප්‍රතිශතය සියයට 19 ත් සියයට 70 ත් අතර පැවතුණි. | පැල මියයාමේ ප්‍රතිශතය 5% ක මට්ටමක පවත්වාගතයුතු අතර ඒ සඳහා විකල්පයක් ලෙස කැලසීකරණ තවාන් ආරම්භකර පවත්වා ගැනීමට සහ අනුමැතිය ලබාදී ඇති අතර එවැනි විකල්ප සැලසුම් අනුගමනය නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස එම තවාන් වල පැල මියයාමේ ප්‍රතිශතය ඉහල ගොස් ඇත. මෙම තත්ත්වය ඉදිරියේ දී වළක්වාගැනීමට දැනටමත් පියවර ගෙන ඇත. | තවාන් කළමණාකරන උපදෙස් මාලාවට අනුව සහ විකල්ප සැලසුම් මඟින් පැළ මියයාමේ ප්‍රතිශතය සියයට 5 ක මට්ටමක තබා ගත යුතුය. |
| (ඇ) තේ ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය වන වාර්ෂික රිකිලි තේ පැළ අවශ්‍යතාව සපුරාගැනීම සඳහා තේ පැළ මිලියන 25 ක විශේෂ තේ පැළ තවාන් ඇති කිරීමේ තවාන් 500 විශේෂ ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර ඒ සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අරමුදල්වලින් ලැබී | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අරමුදලින් රුපියල් මිලියන 75 ක මුදලක් අධිකාරියට ලැබුනු අතර ප්‍රතිලාභීන් තෝරා ගැනීම , තෝරාගත් ප්‍රතිලාභීන් වෙත ද්‍රව්‍යාධාර ලාබාදීම සඳහා යෙදවුම් ද්‍රව්‍ය ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමෙදි පැවැති කොවිඩ් තත්ත්වය මත සැලකියයුතු ප්‍රමාදයක් සිදුවූ අතර අපේක්ෂක කටයුතු ප්‍රමාද විය. මේ වන විට එම මුදල් ප්‍රශස්ථ කරුණු සඳහා යොදවා ඇති අතර දෙවන වාරිකය සඳහා රු.මි.125 ලබාගැනීමටත් එම මුදල් නිසි පරිදි ගෙවීමත් සිදු කර ඇත. | ලද මුදල් කඩිනමින් උපයෝජනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| තිබුණු රුපියල් මිලියන 75 ක මුදලින් රුපියල් මිලියන 29.75 ක් වැය කර පැළ 17,675,000 ක ධාරිතාවයක් සඳහා කුඩා තේ වතුහිමියන්ට ආධාර ලබා දී තිබුණි. එසේ වුවත් ලද අරමුදලින් රුපියල් මිලියන 45 ක් එනම් සියයට 60 ක් සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ඉතිරි වී තිබූ බව නිරීක්ෂණය විය. | | |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වාර්ෂික අයවැය යෝජනා අනුව කුඩා තේ ඉඩම්වල නිවැරදි කෘෂිකාර්මික පිළිවෙත් නියමිත පරිදි සිදුකිරීමට දිරිගැන්වීම සඳහා අවශ්‍ය කෘෂි උපකරණ කුඩා තේ වතු හිමියන්ට බෙදාදීම සඳහා රු. මිලියන 250 ක මුදලක් කැබිනට් අනුමැතිය මත ලැබී තිබුණු අතර අවශ්‍යතාවයට වඩා යන්ත්‍ර මිලට ගැනීම හේතුවෙන් සහ බෙදාහැරීමේ නිශ්චිත ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් රු. 94,408,739 ක් වටිනා මුල්ළු, උදළු, අලවංගු, වතුර මෝටර්, දියර ඉසින යන්ත්‍ර යනාදී කෘෂි උපකරණ | කුඩා තේ වතු හිමියන් වෙත බෙදා දීමට දියර ඉසින හා වතුර මෝටර් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් මිලදී ගෙන 2019 වර්ෂයේ දෙසැම්බර් අවසාන දින වලදී ප්‍රධාන කාර්යාලයේ ගබඩාව වෙත සපයා ඇත. අනෙකුත් ආයුධ කට්ටල 2019 වර්ෂයේ පැවති මැතිවරණ හේතුවෙන් තොග බෙදා දීම් මැතිවරණ කොමසාරිස් විසින් අත්හිටුවා තිබුණි. එසේම 2020 වර්ෂයේ පැවති වසංගත තත්වය යන කරුණු හේතුවෙන් කුඩා තේ වතු හිමියන් රැස්කරවා පුහුණු වැඩසටහන් පවත්වා කෘෂි උපකරණ බෙදා දීමට නොහැකිව ගබඩාවල තොග පවත්වා ගැනීමට හේතු විය. නමුත් 2021 වර්ෂයේ මෙම තොග බෙදාදීමට ඉදිරි කටයුතු සූදානම් කර ඇති බව දන්වා සිටිමි. | නිශ්චිත ක්‍රමවේදයකට අනුව උපකරණ බෙදාදීමට කඩිනමින් පියවර ගත යුතුය. |

ඒකක 13,650 ක් උපයෝජනයට නොගෙන සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශිය කාර්යාල තුළ ගබඩා කර තිබුණි.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සහකාර කළමණාකරු (මානව සම්පත්/ පාලන) තනතුර 2019 මැයි 31 දින සිට පුරප්පාඩුව පවතින අතර වර්ෂ 02 ක් ගතවුවද එම තනතුර පිරවීමට අපොහොසත් වී තිබුණු අතර ප්‍රාදේශීය කාර්යාල 08 න් ප්‍රාදේශීය කාර්යාල 04 ක ප්‍රාදේශීය කළමණාකරු තනතුරු 04 ක් සමාලෝචිත වර්ෂය අවසානයට පුරප්පාඩුව පැවතුණි. එමෙන්ම තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරීන් 17 ක පුරප්පාඩු 2020 දෙසැම්බර් 31 දිනට පිරවීමට කටයුතු කර නොතිබුණ අතර ඵලදායී ව්‍යාප්ති සේවාවක් සඳහා තේ ගොවි හා තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරි අනුපාතිකය 1:1000 ක් පමණ විය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට එය 1:2807 ක් බව නිරීක්ෂණය වේ. | 2019.05.31 දින සිට මෙම අධිකාරියේ සහකාර කළමනාකරු (පාලන) තනතුරේ පවතින පුරප්පාඩුව සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලැබී තිබු අතර, බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානයන්ට අනුකූලව 2019 වර්ෂයේදි තනතුර සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට සම්මුඛ පරීක්ෂණය සඳහා 2019.09.17 දින යොදා ගන්නා ලදි. අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ඒ සඳහා අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් 2019.09.17 දින සම්මුඛ පරීක්ෂණය පවත්වන ලද නමුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ හෝ ලකුණු ලැයිස්තුවක් ලබාදීමට කටයුතු කර නොතිබීම හා එම කාලවකවානුවේදි රජය මගින් මැතිවරණ කාලසීමාවක් ප්‍රකාශයට පත්කර තිබීම හේතුවෙන් සියලු බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවීමට සිදුවූ බැවින් මෙම බඳවා ගැනීමද සිදුකර නොමැත.<br><br>උක්ත තත්ත්වය හා තනතුරේ පවතින පුරප්පාඩුව කඩිනමින් සම්පූර්ණ කිරිමේ අවශ්‍යතාවය වැවිලි අමාත්‍යාංශයට හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීමෙන් අනතුරුව ලබාදී ඇති උපදෙස් පරිදි 2019.09.17 දින පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණය අවලංගු වූවා සේ සලකා නැවතත් තනතුර සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානයන්ට අනුකූලව බාහිර හා අභ්‍යන්තර නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවා 2021.01.07 සම්මුඛ පරීක්ෂණයක් නැවත පැවැත්වීමට කටයුතු කර ඇත.<br>එම සම්මුඛ පරීක්ෂණයද අවලංගුකර නැවතත් අයදුම්පත් කැඳවා සම්මුඛ | පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කඩිනම් කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | පරීක්ෂණයක් නැවත පැවැත්වීමට රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලැබී ඇති උපදෙස් අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දී ඇති අනුමැතිය අනුව නැවතත් අයදුම්පත් කැඳවීමට නියමිතව ඇත.<br>අධිකාරියේ ප්‍රාදේශිය කළමනාකරු තනතුරේ පැවති පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට 2019.08.06 දින පැවති සම්මුඛ පරීක්ෂණය අමාත්‍යාංශයේ අංක MPI/Admin/09/Vacancies/TSHDA/ V-VII හා 2019.11.21 දිනැති ලිපියට අනුව අවලංගු කර ඇත.<br><br>ඉන් අනතුරුව නැවතත් බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන පරිදි 2020.08.17 දින අභ්‍යන්තර අයදුම්කරුවන් ගෙන් අයදුම්පත් කැඳවූ අතර ඒ සම්බන්ධයෙන් පැන නැගුණ ගැටලුකාරි තත්ත්වයක් සම්බන්ධයෙන් රාජ්‍ය අමාත්‍යාංශයෙන් කරන ලද විමසීමකට අනුව, ලැබී ඇති අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම අවලංගු කර ඒ සම්බන්ධයෙන් නැවතත් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් නැවත පැවැත්වීමට රාජ්‍ය අමාත්‍යාංශයෙන් උපදෙස් ලැබී ඇත. ඊට අදාලව අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දී ඇති අනුමැතිය අනුව නැවතත් අයදුම්පත් කැඳවා බඳවා ගැනීම් සිදුකිරීමට නියමිතව ඇත.<br>තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට ප්‍රසිද්ධ දැන්වීම් පළකර අයදුම්පත් කැඳවා ඇති අතර බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන පරිදි පැවැත්විය යුතු බඳවා ගැනීමේ තරඟ විභාගය පවතින වසංගත තත්වය හමුවේ පැවැත්වීමට නොහැකි වීම හේතුවෙන් බඳවා ගැනීම් සිදුකිරීම ප්‍රමාද වී ඇත. | |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 | 2019 වාර්ෂික වාර්තාව කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් දින 150 කට වඩා ප්‍රමාද වුවද දැනට වාර්ෂික වාර්තාව භාෂා පර්වර්තනයෙන් පසු කැබිනට් අනුමැතිය | චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 150 කට පසු විගණිත ගිණුම් සමග විගණකාධිපති වාර්තා භාෂාත්‍රයෙන්ම පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් විගණිත දින වන විට අවසන් වරට සභාගත කර තිබුණේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව පමණි. | සඳහා ඉදිරිපත් කර ඇත. | |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් ඉදිරිපත් කර නොතිබුණි. | වැඩිදුර උපදෙස් අමාත්‍යාංශය වෙතින් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. | මු.රෙ ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**4.3 තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ “2030 න්‍යාය” පත්‍රයට අනුව මණ්ඩලය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ලඟාකර ගතයුතු ඉලක්ක සහ ඒවායේ | 2021 වර්ෂයේ හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු 2020 වර්ෂයේදීද ඒ අයුරින්ම කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් හඳුනා ගෙන ඇති අතර ඒවා ක්‍රියාත්මක කර ඇත.<br>ඉහත සියළුම වැඩසටහන් ඒ ඒ වැඩසටහනට අදාල ආකාරයේ (KPI) දර්ශක මඟින් ප්‍රගතිය මැනීම ප්‍රගති වාර්තා වලින් සිදු කරන අතර ආදායම ඉහල දැමීම ජීවන තත්වය උසස් කිරීම , සමාජ සාධක මැනීමත් සිදු | 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතට අනුකූලව තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක සහ ප්‍රධාන කාර්යසාධක දර්ශක හඳුනාගත යුතුය. |

ප්‍රගතිය මැනීම සඳහා සුදුසු දර්ශකද වාර්ෂිකව ලඟාකර ගත යුතු සංධිස්ථානද හඳුනාගෙන ඇතුළත් කර නොතිබුණි.

කිරීමත් ආයතන විෂය පථය යටතේ කළ නොහැකිය.

එසේ වුවද 2020 උඩරට, මැදරට හා පහත් බිම් ලෙස කාර්යඵල දර්ශකයන් සකස් කර එහි ප්‍රගතිය මැනීමත් හා 2021 වසරේ කුඩා තේ වතු අංශයේ සමස්ථ ඉලක්කය කිලෝ ග්‍රෑම් මිලියන 230 ලෙස මැනීමේ සංධිස්ථාන ඇති කරගෙන ඇත.